# පුස්කොළ පොත්වල ඇතුළත් අතිරේක දත්තවල (Colophon data) ඓතිහාසික වැදගත්කම

- ගාල්ලේ ධම්මින්ද හිමි

කොලෆොන් (Colophon) ලතින් භාෂාවේ *colophōn* යන්නෙන් බින්නව සකස් වූ වචනයකි. විකිපීඩියා (Wikipedia, The Free Encyclopedia) දක්වන පරිදි 'කොලෆොන්' හි අර්ථය වන්නේ, කිසියම් ප්‍රකාශනයක (Publication) ඒ පිළිබඳ කෙටි විස්තරය එනම්; ප්‍රකාශන ස්ථානය, ප්‍රකාශක සහ ප්‍රකාශන දිනය ආදියයි.[1] තවද කොලෆොන් චිත්‍රාත්මක හෝ කිසියම් ලාංඡනයකින් වුව ද දක්වා ඇති අවස්ථා ද තිබේ. පැරන්නන් විසින් 'කොලෆොන්' ග්‍රන්ථාවසානයේ දක්වා ඇති අතර නූතන රචකයන් මුද්‍රිත කෘතියේ ප්‍රථම භාගයේ වම්පස හෝ දකුණුපස පිටුව මේ සඳහා යොදා ඇති අවස්ථා සුලභය. එය බොහෝ විට කෘතියේ නමට පහළ පිටුවේ (title-leaf) හෝ පොත පසුපස පිටුවෙහි දක්නට ලැබේ. 'කොලෆොන්' වෙනුවෙන් ම මෙම කෙටි සටහන යොදනු ලැබුයේ පාඨක පහසුව තකාය. මෙතැන් සිට කොලෆොන් වෙනුවට 'අතිරේක දත්ත' ලෙස යොදනු ලැබේ.

මෙම ලිපියේ ප්‍රමුඛතම අරමුණ වන්නේ පුස්කොළ පොත් ලේඛනයේදී හමුවන අතිරේක දත්තවල ඓතිහාසිකත්වය විමර්ශනය කිරීමයි. මේ සඳහා පාලියෙන් රචිත ත්‍රිපිටක පුස්කොළ පොත් කිහිපයක් ඇසුරු කිරීමට අපේක්ෂිතය. සපිළිවෙළින් අංගුත්තරනිකාය, දීඝනිකාය, මජ්ඣිමනිකාය හා සංයුත්තනිකාය යන පුස්කොළ පොත් අවශ්‍ය ප්‍රමාණයෙන් මෙම පර්යේෂණය සඳහා භාවිතයට ගැනුණි.

## අංගුත්තරනිකාය - ගල්ලෙන්ගොල්ල පොත්ගුල් විහාරය, වට්ටපප්පල, මහනුවර (මධ්‍යම පළාත)

පළමු පිටුව 'ස්ව ක යති' (පැහැදිලි නැත) ලෙස ආරම්භකොට ඇත. දෙවන පිටුව අරඹා ඇත්තේ කා අක්ෂරයෙනි. 'එකගන්ධම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තජ පරියාදාය තිට්ඨති යථ ඉදං භික්ඛවෙ ඉත්ථීගන්ධො ඉත්ථීගන්ධො භික්ඛවෙ පුරිසස්ස භික්ඛවෙ චිත්තං පරියාදාය තිට්ඨතීති' ලෙස අංගුත්තරනිකායේ ඒකක නිපාතයේ

පළමු වග්ගය වන චිත්තපරියාදාන වග්ගයෙන් ආරම්භ කර ඇත. අංගුත්තරනිකායේ පළමු (පඨම) සූත්‍රය ('එවං මෙ සුතං; එකං සමයං භගවා...' ආදී වශයෙන් ආරම්භ වන අතර 'චිත්ත පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිරූපං. ඉත්ථිරූපං භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති.')

**නාහං භික්ඛවෙ අඤ්ඤං එක සද්දම්හි සමනුපස්සාමි, යං එවං...**
**නාහං භික්ඛවෙ අඤ්ඤං එක ගන්ධම්පි සමනුපස්සාමි, යං එවං...**

වශයෙන් ඉදිරියට ගලායයි. මෙම පුස්කොළ රචනාවට බොහෝ පසුකාලයක සංස්කරණය වූ බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ දක්වා ඇත්තේ අප දෙවනුව දැක්වූ ආකාරයෙනි. එනමුත් පුස්කොළ රචනය ආරම්භව ඇත්තේ, 'එක ගන්ධම්පි සමනුපස්සාමි' යන තැනිනි. එනම් සූත්‍රයේ තෙවන ඡේදය (කොටස) ත් ඉක්මවාය. මෙය අතපසුවීමක් ද නොඑසේ නම් අස්ථානගත වීමක්දැයි වෙනමම විමසිය යුතුය.

අංගුත්තරනිකායේ සූත්‍ර ප්‍රමාණය 9557 බව සාම්ප්‍රදායික පිළිගැනීමයි.[2] එසේ පමණි. එම සංස්කාරක මණ්ඩලය ද තමන් සන්තකව සූත්‍ර 780ක් නොමැති බව පිළිගනී. අංගුත්තරනිකායේ සූත්‍ර සංඛ්‍යාව ඒ ඒ නිපාතවලට අනුව මෙසේ දැක්විය හැකිය.

| | |
|---|---|
| ඒකක නිපාතයෙහි සූත්‍ර | 1000 |
| දුක නිපාතයෙහි සූත්‍ර | 753 |
| තික නිපාතයෙහි සූත්‍ර | 359 |
| චතුක්ක නිපාතයෙහි සූත්‍ර | 752 |
| පඤ්චක නිපාතයෙහි සූත්‍ර | 1167 |
| ඡක්ක නිපාතයෙහි සූත්‍ර | 662 |
| සත්තක නිපාතයෙහි සූත්‍ර | 1124 |
| අට්ඨක නිපාතයෙහි සූත්‍ර | 627 |
| නවක නිපාතයෙහි සූත්‍ර | 432 |
| දසක නිපාතයෙහි සූත්‍ර | 756 |
| ඒකාදසක නිපාතයෙහි සූත්‍ර | 1151 |
| **එකතුව** | 8777 |

## අවසානය

'ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති.' යනුවෙන් අංගුත්තරනිකායේ සූත්‍ර දැක්වීම අවසන්කොට ඇති අතර 'සිද්ධිරස්තු, සුභමස්තු, ආරොග්‍යමස්තු, මංගලං අස්තු' ආදී වශයෙන් ආශීර්වාද කිරීමෙන් නිමාකොට ඇත. ඉතිරිව පවතින පත්තිරු සංඛ්‍යාව හයසිය හතළිස් දෙකකි.

## ග්‍රන්ථ විස්තරය

"මේ පොත ගල්ලැංගොල්ලෙං ගෙනත් පමුනුවේ පොත්ගුලේ තැබුවේ ආරාණ්‍යාධිවාසි සුමන ස්ථවිරයන් වහන්සේ විසින්ය. වර්ෂ 1894 දීය. පවුං පහක් බරක්බර පැන්ගෙවා ඇරගෙන සාංඝික වසයෙන් පූජා කලාය සද්ධාවන්ත ග්‍රහස්ථ ප්‍රවෘජ්ජිතයන් විසින් බලාගන්නට ලියාගන්නට ඕනෑ කලා නම් මෙම ඉස්ථානේ ප්‍රධාන සංඝයාගෙන් සහ ප්‍රධාන දායකයන්ගෙත් කැමැත්ත පිට ගෙනයන අයගෙනමත් සාක්ෂියට දෙතුං දෙනෙකුත් ඇතුව අවුරුද්දකිං වැඩිනොවන කාලයක් භාවිතාකොට ගෙනත් තබන ලෙසත් යං අනතුරක් උණොත් නැවත ලියවා සම්පූර්ණකොට තබන ශටියට පොරොන්දු කරලියා අත්සන්ගෙන පොත දෙන්න හොඳයි එසේ නොව විකුනන්ටවත් උකස් කරවන්නටත් තෑගිකොට දෙන්ටවත් එපා යම්සේ නැති නාස්ති කළොත් අනන්ත කාලයක් හතර අපාදුක් විදනවා ඇත.

යම් කෙනෙකු විසින් පුද්ගලික වසයෙන් ගනුදෙනුකරන්ට තුනුරුවන්ගේ....තහනම්...මේ බවට ආරණ්‍යාධිවාසී නාපාන සුමන ස්ථවිර වන මමය."

මෙම පුස්කොළ ග්‍රන්ථය අයත් වන්නේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගල්ලෙන්ගොල්ල පොත්ගුල් විහාරයටයි. මහනුවරින් පිළිමතලාවේ සිට පරණපට්ටිය මාර්ගයේ කිලෝ මීටර් හතරකට ආසන්න දුරක් යනවිට රමණීය භූමියක පිහිටි ගල්ලෙන්ගොල්ල පොත්ගුල් විහාරයේ වර්තමාන අධිපතිත්වය උසුලන්නේ, කළුන්දෑවේ විමලසිරි හිමියන්ය. සිරි ලංකා රාමඤ්ඤ මහානිකායට අයත් ඉපැරණි

විහාරස්ථාන අතුරින් එකක් ලෙස මෙම විහාරය සැලකිය හැකිය.

**ග්‍රන්ථ විස්තරය**

| | |
|---|---|
| පත් ඉරු සංඛ්‍යාව | 1220 |
| පත් ඉරු අංකනය | ක, දෙ, චා |
| පේළි | 8-9 |
| පත් ඉරුවල ප්‍රමාණය | පළල සෙ.මී. 55 දිග සෙ.මී. 06 |

ක්‍රි.ව. 1894 දී රචිත මෙම පුස්කොළ ග්‍රන්ථය අසම්පූර්ණ එකකි. එසේ වුවත් පහසුවෙන් කියවිය හැකිය. 'ගො' හා 'සෙ' පත් ඉරු දක්නට නොමැත.

ගල්ලෙන්ගොල්ල වර්තමාන විහාරාධිපති හිමියන්ගේ මුවින් ම පවසන ආකාරයට එහි තතු මෙසේය:

"වැලිගමුවේ අත්ථදස්සී හිමියන්ගේ ප්‍රධාන ගෝලයා තමයි නාපානේ සුමන හාමුදුරුවෝ. මේ පන්සලේ දකින්න තියෙන කළුගලින් නිර්මාණය කරපු චෛත්‍ය උන්වහන්සේ තමයි කරලා තියෙන්නේ. ඒ විතරක් නෙමෙයි ගල්ලැංගොල්ල පන්සල යටතේ පැවති විහාරස්ථාන රාශියකුත් තිබිලා තියෙනවා. මගේ ගුරුවරුන්ගෙන් දැනගත්තු විදිහට තෙලඹුගල පිරිවෙන (නිග්‍රෝධ බෙත්ත මහ පිරිවෙන), හැපාන සුදස්සනාරාමය, කළුගල්ලෙ ජයසුනන්දාරාමය, බෝපිටිය සුමනාරාමය හා පමුණුව ජයසුමනාරාමය වගේ පන්සල් හැම එකක්ම ආරම්භ කරලා තියෙන්නෙත් සුමන හාමුදුරුවෝ.

මුල් කාලයේ මේ පන්සල මල්වතු පාර්ශ්වයේ වනවාසී පරපුරට අයත් පන්සලක්.[3] පස්සේ ගම්පොළ රංකඩඇල්ල උදකුක්ඛේප සීමාවේ උපසම්පදාව ලැබූ සුමන හාමුදුරුවෝ, ඒ කාලේ උඩරට මූලික රාමඤ්ඤ නිකායට තමයි අයත් වුණේ. පස්සේ උඩරට මූලික රාමඤ්ඤ නිකායත් ගිවිසුමකින් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකාය යටතටම පත්වෙනවා.

උඩින් කීව වැලිගමුවේ අත්ථදස්සී හිමියන්ගේ දෙවෙනි ගෝලයා

තමයි රුවන්වැලි චෛත්‍ය හොයාගත්ත නාරංවිට සුමනසාර හාමුදුරුවෝ. වැලිගමුවේ හාමුදුරුවෝ භාවනායෝගීව වැඩ සිටිය හිමිනමක්. උන්වහන්සේ අනුරාධපුරේ කැලෑබදව භාවනායෝගීව ඉඳලා තියෙනවා. ඒ කාලේ තමයි රුවන්වැලි තූපය හොයාගෙන තියෙන්නේ. පස්සේ ඒක නාරංවිට සුමනසාර හාමුදුරුවන්ට පවරලා. රාමඤ්ඤ නිකායික භික්ෂුවක් වෙච්චි සුමනසාර හාමුදුරුවෝ එම නිකායෙන් ඉවත්වෙලා සියම් නිකායට බැඳිලා තියෙනවා රුවන්වැලි චෛත්‍යාරාමයේ අධිපතිත්වය දරන්න. මං දැන් කියන්නම් මේ පන්සලේ විහාරාධිපතිවරුන්ගේ ලැයිස්තුව, එතකොට නාපානේ සුමන හාමුදුරුවන්ගෙයි නාරංවිට සුමනසාර හිමියන්ගෙයි සම්බන්ධය ගළපා ගන්න පුළුවන් වේවි ඔබවහන්සේට.” වත්මන් විහාරාධිපති හිමියන් දක්වන ලද එම ලැයිස්තුව මෙසේය.

1. වැලිගමුවේ අත්ථදස්සි හිමි
2. නාපාන ශ්‍රී සුමන හිමි
3. මද්ගොමුවේ හෙට්ටිගෙදර ධම්මජෝති හිමි
4. හුරීකඩුවේ පඤ්ඤාරංසී හිමි
5. වල්මෝරුවේ ධම්මාලෝක හිමි (අවස්ථා දෙකකදී අධිපතිත්වය දරා ඇත)
6. කළුන්දෑවේ අමරසිරි හිමි
7. කණ්ඩලමේ සුසීල හිමි
8. කළුන්දෑවේ විමලසිරි හිමි (වර්තමාන විහාරාධිපති)

වත්මන් විහාරාධිපති හිමියන් විසින් දක්වන ලද අතිශය වැදගත් කරුණක් පිළිබඳ අප අවධානය යොමු විණි. එනම්, සුමන හිමියන් විසින් පන්හිඳෙන් ලියන ලද ‘රාජසිංහ රජතුමන්ගේ නිර්දෝෂීභාවය’ නම් පිටු හතරක ප්‍රමාණයේ සටහනක් විහාරස්ථානයේ පොත්ගුල සතු වන බවයි. නාපාන හිමියන්ගේ පුස්කොළ පිටපත් රචනය අයත්වන්නේ ක්‍රි.ව. 1894ටය. ශ්‍රී වික්‍රම රාජසිංහ, සිංහලේ අවසන් රජ විසින් මනුෂ්‍ය ඝාතන පහක් (ඇහැලේපොල කුමාරිහාමි, දරුවන් සිව්දෙනා; ගැහැනු දරුවන් 1, පිරිමි දරුවන් 3) නැසීමට විධානය කරනු ලබන්නේ ක්‍රි.ව. 1814 දීය.[4] ඉදින් මෙම සිදුවීමෙන් වසර 80කට පසුව උක්ත පුස්කොළ ලේඛනය රචනා විණි. රාජසිංහ රජු පිළිබඳ ලියවිල්ල

ඇසුරු කිරීමෙන් තොරව මේ පිළිබඳ යමක් කීම නොමනාය. එසේ වුවත් නාපාන හිමියන්ට මෙම සාහසික සිදුවීම පිළිබඳ සමීප නොවූත් දූරස්ථ නොවූ අත්දැකීමක් පවතින්නට ඇති බව උපකල්පනය කළ හැකිය. මෙම ලියවිල්ල පිළිබඳ අප අවධානය යොමු වූවත් ඒ පිළිබඳ පසුවට අධ්‍යයනය කිරීමේ අටියෙන් විහාරාධිපති හිමියන් සමග නැවත සාකච්ඡාව ආරම්භ කෙරිණි.

උන්වහන්සේ දැනුවත් කළ පරිදි ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේ තේරීමේදී ඡන්ද බලය (4.1 වගන්තිය) හිමි සිරි ලංකා රාමඤ්ඤ මහා නිකායික විහාරස්ථාන දෙකෙන් එක් විහාරස්ථානයකි මෙම ගල්ලැංගොල්ල විහාරය. අනෙක් විහාරස්ථානය වන්නේ ගැටඹේ රාජෝපවනාරාමයයි.

මෙම විහාරස්ථානයේ සිදුකළ සංචාරයේදී දක්නට ලැබුණු තවත් එක් සුවිශේෂ ඉදිකිරීමක් ලෙස තෙමහල් විහාර මන්දිරය හඳුන්වාදිය හැකිය. මෙහි තෙවන මහල හුදෙක් අලංකාරය සඳහා ඉදිකොට ඇති අතර දෙවන මහලේ සහ බිම් මහලේ වන්දනා කිරීම සඳහා ප්‍රති පිළිම රාශියක් නිර්මාණය කොට ඇත. විහාරයේ දෙවන මහලේ සොල්දොරය තනි කුඹුක් ලීයෙන් නිමවා ඇත. විහාර සිවිලිම ද මහනුවර යුගයට අයත් චිත්‍රවලින් අලංකාර කර ඇත.

පැරණි ගම්වැසියන්ගේ විශ්වාසයට අනුව නාපානේ හිමියන් සියලු පුස්කොළ රචනා කර ඇත්තේ අසල පිහිටි ස්වාභාවික ගල් ලෙනෙහි වැඩ සිටිමිනි. තවද පුස්කොළ තැන්පත් කරන ලද අඩි 7x4 තරම් ප්‍රමාණයේ ලී පෙට්ටිය ද තවමත් නිරුපද්‍රිතව පවතී. මෙම ලී පෙට්ටිය පුරාවට අඳින ලද අලංකාර චිත්‍ර එයට අමතර කලාත්මක වටිනාකමක් ද එක්කොට ඇත.

මෙසේ ග්‍රන්ථාවසානයේ දක්වා ඇති අතිරේක දත්තවලින් සමකාලීන ආගමික, දේශපාලනික හා සමාජමය තොරතුරු රාශියක් අනාවරණය කරගත හැකිය. බොහෝ දෙනෙකුගේ අවධානය යොමුවන්නේ තත් ග්‍රන්ථ දෙසට පමණි. එහෙත් ඒවායේ ඇතුළත් අතිරේක දත්ත ඉතා වැදගත් ඓතිහාසික වාර්තාවක් ඉදිරිපත් කෙරෙන බව මෙමගින් පැහැදිලිය.

**අංගුත්තරනිකාය, වරාවල රජමහ විහාරය, නැලව (වයඹ පළාත)**

මෙය ඉතා පැහැදිලි අක්ෂරවලින් ලියන ලද එසේම සම්පූර්ණ පුස්කොළ ග්‍රන්ථයක් ලෙස ශේෂව පවතී. දැනට වරාවල රජමහ විහාරස්ථානයේ සුරක්ෂිතව පවතින මෙම පුස්කොළ රචනයේ කම්බයේ විචිත්‍රව අඳින ලද චිත්‍ර කිහිපයකි. සාම්ප්‍රදායික සිත්කම්වලින් එය අලංකාර කර ඇත.

කෘතිය ආරම්භ කරන්නේ නමස්කාර පාඨයෙනි. එතැන් සිට අංගුත්තරනිකායේ පළමු සූත්‍ර පාඨය **"එවං මෙ සුතං...නාහං භික්ඛවෙ අඤ්ඤං එකසද්දම්පි සමනුපස්සාමි..."** ආදී වශයෙන් ආරම්භ කෙරේ.

**ග්‍රන්ථ විස්තරය**

| | |
|---|---|
| පත් ඉරු සංඛ්‍යාව | 672 |
| පත් ඉරු අංකනය | 'ක' සිට 'පඃ' දක්වා |
| එක් පත් ඉරුවක පේළි සංඛ්‍යාව | 9-10 |
| පේළියකට අකුරු ගණන | 185 පමණ |
| පුස්කොළයක ප්‍රමාණය | පළල - සෙ.මී. 72 |
| | උස - සෙ.මී. 6.5 |
| ලේඛක | දරමිටිපොල සාමණේර |
| ලිඛිත වර්ෂය | සක වර්ෂ 1658 |

කෘතියේ කර්තෘත්වය දරන්නේ දරමිටිපල සාමණේරයන් වන අතර උන්වහන්සේගේ ප්‍රාර්ථනාවකින් ග්‍රන්ථය නිමාකොට ඇත.

**"ඉමං ලිඛිත පුඤ්ඤෙන මෙත්තෙය්‍යමුපසංකම් පතිට්ඨහිත්වා සරණෙ සුප්පතිට්ඨාමි සාසනෙ". (මෙය ලියන ලද පිනෙන් මෛත්‍රී බුද්ධ ශාසනය වෙත පැමිණ සරණෙහි පිහිටමි.)**

නුවනැත්තන් කෙරෙහි අග්‍රවෙම්වා. ලංකාද්වීපයෙහි ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ නම් මහරජහු රජ කරණ දවස උපෞසථාරාමවාසී වූ වැලිවිට සරණංකර සාමීන්ගේ ශිෂ්‍ය වූ දරමිටිපල සාමණෙරයන් විසින් සක වසින් එක්දහස් සසිය පණස් අටවෙනි වර්ෂයෙහි ලෝ සසුන්

වැඩ පිණිස හා තමන්ට සම්‍යක් සම්බෝධිය පිණිස ලියවූ අංගෝත්‍ර සඟියයි. සිද්ධිරස්තු".

මෙය ලියන කාලය වන විට ලංකාද්වීපයෙහි රාජත්වය දරා ඇත්තේ ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමන් විසිනි. එනම් බුද්ධ වර්ෂ 2444 යි. ක්‍රිස්තු වර්ෂවලට අනුව 1707-1739 අතර කාලයේ මෙතුමා රජ කළේය. දෙවන විමලධර්මසූරිය රජුගේ (1687-1707) පුත්‍රයා වන මොහුගේ පියාගේ පියා වන දෙවන රාජසිංහ (1635-1687) රාජ්‍ය විචාළේය. අවසන් සිංහල රජු ලෙස සැලකෙන ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහගෙන් පසුව වසර 76 නායක්කාර් වංශිකයන් විසින් කන්ද උඩරට රාජධානිය පාලනය කරන ලදි. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහගෙන් පසුව කන්ද උඩරට පාලනය කළ නායක්කාර වංශික පාලකයන් පිළිවෙළින් මෙසේය.

I. ශ්‍රී විජය රාජසිංහ (1739-1747)
II. කීර්ති ශ්‍රී රාජසිංහ (1747-1782)
III. රාජාධිරාජසිංහ (1782-1798)
IV. ශ්‍රී වික්‍රම රාජසිංහ (1798-1815)

ඓතිහාසික වශයෙන් ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහගේ පාලන කාලය ඉතා වැදගත් යුගයකි. සිය පියාගේ අභාවයෙන් පසුව රජ පැමිණි හෙතෙම ලංකා රාජ්‍යය රක්ෂා කිරීම සඳහා මධුරා පුරයෙන් ද රාජ කන්‍යාවන් ගෙන්වා අගමෙහෙසුන් කොට දානාදි පින්කම් හා දන්තධාතු පූජාදිය දිනපතා සිදු කළ බවත් බොහෝ ශාසනික කාර්යයන් ද සිදු කළ බවත් මහාවංසයේ අනූහත්වෙනි පරිච්ඡේදයේ දැක්වේ.[5] අතිරේක දත්තවල සඳහන් පරිදි දරමිටිපල සාමණේරයන් වැලිවිට සරණංකර හිමියන්ගේ ශිෂ්‍යවරයෙකි. මෙම කාලය වන විට රජුත් වැලිවිට හිමියනුත් අතර ශාසනික බැඳීමක් පැවති බවට මහාවංස සාක්ෂ්‍යවලින් ද නිගමනය කළ හැකිය.[6]

මෙම කෘතියේ ප්‍රකාශිත වර්ෂය දක්වන පරිදි ශක වර්ෂ 1658 වේ. එනම් ක්‍රිස්තු වර්ෂ 1736 යි. ශ්‍රී නරේන්ද්‍රසිංහ රාජත්වයට පත්වන්නේ ක්‍රිස්තු වර්ෂ 1707 දීය. මෙම රචනය සිදුවන්නේ එයින් වසර 29කට

පසුවය. එතුමා වසර පනස් දෙකක් රාජ්‍ය විචාළ බව මහාවංසය කියයි.[7] වැලිවිට සරණංකර හිමියන්ගේ ශාසනික පුනර්ජීවන කාර්ය සම්බන්ධයෙන් උක්ත පුස්කොළ රචනය යම් උපකල්පිත සාක්ෂ්‍යයක් සපයයි. මෙහි කර්තෘත්වය හිමිවන්නේ දරමිටිපල සාමණේරයන්ට ය. මේ කාලය වන විට ලාංකේය භික්ෂු උපසම්පදාව අර්බුදකාරී තත්ත්වයක පැවතුණි. ඇතැම් විට ලේඛක හිමියන් අනුපසම්පන්නයෙකු වුවත් දැන උගත්, විසි වයස් ඉක්ම වූ භික්ෂුවක් විය යුතුය. නොඑසේ නම් මෙවැනි භාරදූර කාර්යයක් උන්වහන්සේ වෙත නොපැවරෙනු ඇත. සමකාලීනව පැවති ශාසනික අර්බුද හමුවේ උන්වහන්සේගේ උපසම්පදාව ද ප්‍රමාද වූවා විය හැකිය. තවද මෙම යුගයේ සරණංකර හිමියන් සිදුකළ ශාසනික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය පිළිබඳ තවත් එක් නිදසුනක් ලෙස ද මෙය හැඳින්විය හැකිය.

දේශපාලනික වශයෙන් මෙතුමාගේ පාලන තන්ත්‍රය අතිශය විවාදාපන්න කාලයකි. රාජත්වයට පත්වන විටත් දාහත් වියැති දහර තරුණයෙකු වූ හෙතෙම සෙල්ලක්කාර දිවියක් ගෙවූවකු ලෙස සැලකේ. 'සෙල්ලම් නිරිඳු' යනුවෙන් ජනතාව විසින් රජු හඳුන්වනු ලැබිණි. ස්ත්‍රී ලෝලත්වය හා මත්පැන් පානය සම්බන්ධයෙන් හෙතෙම කුප්‍රසිද්ධව සිටියේය. දේශපාලනික කුමන්ත්‍රණවලින් ගහණ යුගයක් වන මෙකල රදළ බලය ඉහළ මට්ටමක පැවතුණි. රජු සම්බන්ධයෙන් සිංහල බෞද්ධයන්ගේ පැවති විරෝධය වූයේ කතෝලිකයන් සම්බන්ධයෙන් රජුගේ පැවති හිතෛශීභාවයයි. එහි උච්චතම අවස්ථාවට පැමිණි රජ පේදුරු ගස්කොන් තම පුරෝහිත තනතුරෙහි තබාගත්තේය. එපමණක් නොව 1739දී මොහු මිය යන මොහොතේ කතෝලික පල්ලියෙන් ගෙන්වා ගත් ශුද්ධ ජලය පානය කළ බව 'ගොන්සාල්වේස් චරිතයේ' සඳහන්ය. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ පාලනයෙන් පසුව මෙරට රාජත්වයේ තීරණාත්මක වෙනසක් සිදුවේ. එනම් මෙතෙක් පැවති පියාගෙන් පුතාට උරුම වූ රජකම මස්සිනා වෙත පවරාදීමයි. එය ඓතිහාසික වශයෙන් කිසියම් සුවිශේෂ දේශපාලනික සාධකයකි. මෙවැනි දේශපාලනික තොරතුරු රාශියක් අනාවරණය වීම පුස්කොළ පොතෙහි ඇතුළත් අතිරේක දත්තවල වටිනාකම ප්‍රකට කරනු ඇත.

## දීඝනිකාය, දුටුගැමුණු රජමහ විහාරය, බද්දේගම (දකුණු පළාත)

මෙම පුස්කොළ පොත නමස්කාර පාඨයෙන් ආරම්භ කරයි. එසේම දීඝනිකායේ පළමුවන සූත්‍රය වන බ්‍රහ්මජාල සූත්‍රය

**"එවං මෙ සුතං එකං සමයං භගවා..."** ආදී වශයෙන් අරඹමින් අනතුරුව ලේඛනය සිදුකෙරේ.

මෙහි පත් ඉරු තුන්සිය පනස් පහක් (355) අන්තර්ගත බව කෘතියේ දක්නට ඇත. එසේ වුවත් විද්‍යමානව පවතින්නේ පත්ඉරු 322ක් පමණි. ඒ අනුව පත් ඉරු 33ක්ම විද්‍යමාන නොවේ. මේ පිළිබඳ අදහස් දක්වන පර්යේෂකයන් පෙන්වා දෙන්නේ ඇතැම් විට මුල් අවස්ථාවෙහි අංක රහිතව පත් ඉරු වැඩි ප්‍රමාණයක් තිබෙන්නට ඇති බවත් පසුව ඒවා ඉවත් කරන්නට ඇති බවත්ය.[8] කෘතියේ අක්ෂර රටාව හා පසුවදනෙහි අක්ෂර එකිනෙක වෙනස් ස්වරූපයක් ගනී. අතිරේක විස්තර පසුව ලියූ බවක් මේ නයින් උපකල්පනය කළ හැකිය. නොඑසේ නම් පිටපත හා අතිරේක විස්තරවල අක්ෂර දෙදෙනෙකුට අයත් වේ. ඇතැම් විට ගණනය කිරීමකින් තොරව පසුව ලියූ තැනැත්තා විසින් පත් ඉරු සංඛ්‍යාව අනුමාන වශයෙන් දැක්වූවා විය හැකිය. එවිට සැබෑ එකතුව හා අංකනය (Pagination) දෙකක් වීම වළක්වාලිය නොහැකිය. මේ කුමන තත්ත්වයක් පැවතිය ද සූත්‍රවල අන්තර්ගතයේ අඩුවක් නොමැත.

මෙහි කර්තෘත්වය හිමිවන්නේ මේධංකර නමැත්තෙකුටය. මේධංකර නාමය පැවිදි භාවය හැඟවූවත් හෙතෙම භික්ෂුවක වශයෙන් හඳුනාගැනීමට ඇති එකම සාක්ෂ්‍ය වන්නේ, කෘතියේ දක්වා ඇති 'මිනුවංගමුවේ පංහලේ පොත්වහන්සේ දිකසගිය' යන ප්‍රකාශයයි. තවද 'මේධංකර' යනුවෙන් අගට යෙදීමෙන් හැඟෙන්නේ මිනුවංගමුව පන්සලට අයත් කෘතියක් බවත් මේධංකර නමැත්තා එහි විසූ භික්ෂුවක් වන බවත්ය.

ඉනික්බිතිව උපසම්පදා විනය කර්මයක් පිළිබඳව සඳහන්වේ. ඒ මෙසේය.

"ශ්‍රී ශුද්ධ ශකරාජ වර්ෂ ප්‍රමාණයෙන් එක්වා දහස් අටසිය විසිහයට පැමිණි මෙම වර්ෂයෙහි මිථුන රවි දහහතරභාග වූ සඳු දින රෑවූ දෙපැය වෙලාවට ශ්‍රී සෙඩිකණ්ඩ ශෛලාභිධාන ශ්‍රී වර්ධන පුර ප්‍රවර උපෞසථ පුෂ්පාරාම විහාරාබ්භ්‍යන්තරයෙහි සුපතිෂ්ඨිත මහළ උපෞසථාගාරයෙහි දී මහනුවර උපෞසථ පුෂ්පාරාම විහාර පදවිය ලැබී කරනව තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ත්ථ සුමංගලාභිධාන මහානායක ස්ථවිරයන් වහන්සේ උපාධ්‍යාව හෙට්ටිපොල ගුණරතන ස්ථවිරයන් වහන්සේ ද වටරක රේවත ස්ථවිරයන් වහන්සේ ද යන මේ දෙනම කර්ම්මාචාරී () ව මිනුවන්ගමුවේ සෝභිත භික්ෂුනමගේ උපසම්පදා මඞ්ගල්ලයය සිද්ධ වුනාය. ශ්‍රී බුද්ධවර්ෂ 2448 ක් වූ පොසොන් මස පුරපසලොස්වක් ලත් සඳු දින දී ය. ක්‍රිස්තුවර්ෂ 1904 ක් වූ ජුනි මස 27 දින දී ය."

මෙම කෘතිය උක්ත උපසම්පදා පිංකමේදී රචනාකොට පූජා කරන්නට යෙදුණු වග ආසන්න වශයෙන් අනුමාන කළ හැකිය. ග්‍රන්ථ විස්තරයේ දැක්වෙන පරිදි උපසම්පත්තියට පත්ව ඇත්තේ මිනුවන්ගමුවේ සෝභිත නම් භික්ෂු නමකි. ඒ අනුව මේධංකර යනු පිටපත්කරුවා පමණක් ම වන බව ඉඳුරාම පැහැදිලිය. මිනුවන්ගමුවේ සෝභිත හිමියන්ගේ උපසම්පදා පිංකමේදී පූජාකිරීම සඳහා මේධංකර තෙමේ මෙම කාර්යයෙහි නිරත වූවා විය හැකිය. සක වර්ෂ, බුද්ධ වර්ෂ හා ක්‍රිස්තු වර්ෂ යන තුන් ආකාරයටම ලිඛිත වර්ෂය දක්වා තිබීම මෙහි පැනෙන තවත් සුවිශේෂත්වයකි.

**ග්‍රන්ථ විස්තරය**

| | |
|---|---|
| පත් ඉරු සංඛ්‍යාව | 714 |
| පත් ඉරු අංකනය | ක සිට නඃ දක්වා |
| පත්ඉරු සංඛ්‍යාව | 320 කි. |

එසේ වුවත් පළමු හා අවසාන පත්ඉරු දෙකක් අංක රහිතව දක්වා ඇති බැවින් සියල්ල 322කි.

| | |
|---|---|
| පේළි සංඛ්‍යාව | 7-8 |
| පුස්කොළයක ප්‍රමාණය | පළල - 6 cm දිග - 58.5 cm |

| | |
|---|---|
| පත් ඉරු අතර අකුරු සංඛ්‍යාව | පළමු පත් ඉරුවේ අකුරු 40- 50 කි. අනෙකුත් ඒවායේ 100-130 වේ. |
| ලේඛක | මේධංකර |
| ලිඛිත වර්ෂය | බුද්ධවර්ෂ 2448, ක්‍රිස්තුවර්ෂ 1904 |

**"ඉති ඉමෙ සතධම්මා භූතා තච්ඡා තථා අවිතථා...දසුත්තර සුත්තං නිට්ඨිතං එකාදසමං"** සහ **"සිගාලාටානාටියකං, සංගීතිං ච දසුත්තරං; එකාදසහි සුත්තෙහි, පාථිකවග්ගොති වුච්චති"** යැයි උද්දේසය දක්වමින් පිටපත නිමකොට ඇත. පරිශීලනයට ඉතා සුදුසු මට්ටමක පවතින පිටපතකි.

## දීඝනිකාය, සුධර්මාරාමය, කපුගම, දෙවිනුවර (දකුණු පළාත)

බද්දේගම දුටුගැමුණු රජමහ විහාරයේ දැකිය හැකි දීඝනිකායික පුස්කොළ ග්‍රන්ථයේ ලේඛකයා වන්නේ, මේධංකර නමැත්තෙකි. සුධර්මාරාමයේ පුස්කොළ පිටපතේ කර්තෘ නාමය සඳහන් වන්නේද මේධංකර යනුවෙනි. මෙම පිටපත් දෙකම එකම රචකයෙකුට අයත්දැයි වෙනම විශ්ලේෂණය කළ යුතුය. එම විශ්ලේෂණය සඳහා පවතින එක් බාධාවක් නම් සුධර්මාරාමස්ථ පිටපතෙහි රචිත කාලය දක්වා නොතිබීමයි.

### ග්‍රන්ථ විස්තරය

| | |
|---|---|
| පත් ඉරු ගණන | 270 (ආරම්භක පත් ඉරු දෙක ගණනය නොකර) |
| පිටු අංකනය | ක සිට තෲ දක්වා |
| දිග | සෙ.මී. 58 |
| පළල | සෙ.මී. 6 |
| පත් ඉරුවක තිබෙන පේළි ගණන | 9 |
| පේළියක ඇති අකුරු ගණන | 45-40 (පළමු පත් ඉරුව) සෙසු පත්ඉරුවල අකුරු 120-150 කි. |
| ලේඛකයා | මේධංකර |

මෙම පුස්කොළ ලේඛනයේ පැනෙන සුවිශේෂතා

- 'ඉමිනා පුඤ්ඤකම්මෙන' ආදී වශයෙන් කෘතිය අවසානයේ ප්‍රාර්ථනා ගාථාව දක්වා තිබීම. බොහෝ පුස්කොළ ලේඛනවල ප්‍රාර්ථනා ගාථාව හමුනොවේ.
- පටුනක් යොදා තිබීම. මෙය කලාතුරකින් හමුවන විශේෂත්වයකි.
- දෙවන පත්ඉරුවේ සූත්‍ර අන්තර්ගතය පත් ඉරු අංක යොදා දක්වා ඇත.
  ණා - චත්තාරො කාමසුඛල්ලිකානුයොගො
  ණෙ - ද්වත්තිංසලක්ඛණානං පටිලාභාය කතම්මවිභාගො
  තෟ - පඤ්ච චෙතොඛිලාදීනං විභාගො
- එතැන් සිට දීඝනිකායික සූත්‍ර අන්තර්ගතය පිළිවෙළින් දක්වා ඇත. කඃ (බ්‍රහ්මජාල සූත්‍රය) සිට ථෞ දක්වා (දසුත්තර සූත්‍රය)
- සීලක්ඛන්ධ වග්ගය බ්‍රහ්මජාලවග්ග යනුවෙන් නම් කිරීම.

මෙම පුස්කොළ රචනය පිළිබඳ වඩා ප්‍රශස්ත ඓතිහාසික විවරණයක නොයෙදිය හැකි එක් බාධාවක් වන්නේ රචිත වර්ෂය සඳහන් නොවීමයි. එසේ නොවූයේ නම් 'මේධංකර' කර්තෘ පිළිබඳ යමක් අධ්‍යයනය කළ හැකිව පවතී. බද්දේගම දුටුගැමුණු විහාරය හා කපුගම සුධර්මාරාමයත් පිහිටා ඇත්තේ දකුණු පළාතේය. ඒ අනුව කෘති දෙකෙහිම හමුවන මේධංකර යනු එක පුද්ගලයෙකු ම විය හැකිය.

**මජ්ඣිමනිකාය, විජයසුන්දාරාරාමය, අස්ගිරිය, මහනුවර (මධ්‍යම පළාත)**

**ග්‍රන්ථ විස්තරය**

| | |
|---|---|
| පත් ඉරු | 1032 |
| පත් ඉරු අංකනය | 1-515 |
| පේළි | 8 |
| පේළියක ඇති අකුරු සංඛ්‍යාව | 120 පමණ |
| ප්‍රමාණය | සෙ.මී. 5.5-5.8 |
| වර්ෂය | බු.ව. 2465 |
| ලේඛක | විලියොන් බංඩා ඇතුළු පිරිස |

ග්‍රන්ථකරණය ආරම්භ කර ඇත්තේ 'ස්වස්ති සිද්ධම්' යනුවෙන් ආශීර්වාදයකිනි. මෙම කෘතිය ලියවා පූජා කරවා ඇත්තේ, ශ්‍රී බුද්ධ වර්ෂ දෙදහස් හාරසිය හැටපහේ (2465) දුරුතු මාසයේ අව අටවක ලත් ගුරු දිනයේදීය. සම්පූර්ණ ලේඛනයකි.

නමො තස්ස භගවතො... ආදී වශයෙන් නමස්කාර පාඨයෙන් ඉනික්බිතිව මූලපරියාය සූත්‍රය ආරම්භ කර ඇත. අවසානය මජ්ඣිමනිකායික ඉන්ද්‍රියභාවනා සූත්‍රයෙනි. සුභමස්තු, ආරෝග්‍යමස්තු, සිද්ධිරස්තු ආදී වශයෙන් ආශීර්වාදයෙන් කෘතිය නිමාකොට ඇත.

### අතිරේක දත්ත විස්තරය

"කටුගම්පලහත්පත්තුවෙ යටිකහ කෝරලේ අස්සද්දුවේ අතපත්තු හේරත් මුදියන්සේලාගේ අප්පුහාමු කෝරලෙ නිලමේ සහ උන්නැහෙගේ ස්ත්‍රී වන මැනික්හාමි පුංචි මහත්මයො දරුවා වන පුංචිබන්ඩා මුහම්දිරම් මහත්මයා ද කුමාරිහාමී ද ඩිංගිරි අම්මා ද මුනුබුරු වන විලියොන් බංඩා ද (පැහැදිලි නැත) යන අපි විසින් ලියවා පූජා කලේ ශ්‍රී බුද්ධවර්ෂ දෙදාස් හාරසිය හැටපහක් වූ ද දුරුතු මස අව අටවක ලත් දුරුතු මස ගුරුදිනදීය."

මෙම විස්තරයට අනුව පුස්කොළ ලේඛනය රචනා කර ඇත්තේ විලියොන් බංඩා නමැත්තෙකි. ව්‍යවහාරික වර්ෂ එනම් ක්‍රිස්තු වර්ෂ 1921යි. ඉහත විස්තරයට අනුව පැහැදිලි වන්නේ, උඩරට එක්තරා කුලීන පෙළපතකට අයත් පිරිසකගේ දායකත්වයෙන් මෙම කාර්ය සිදුවී ඇති බවයි. මෙහි කර්තෘ මෙම පෙළපතේ තෙවන පරපුර නියෝජනය කරයි. නම් සඳහන් සියලු දෙනාම කිසියම් ඥාති පාර්ශ්වයකට අයත් වග අනුමාන කළ හැකිය. විලියොන් බංඩා කර්තෘතුමන් පිළිබඳ වැඩි යමක් සොයාගැනීම දුෂ්කරය.

## මජ්ඣිමනිකාය, නිග්‍රෝධඛෙත්ත මහ පිරිවෙන, ගෙලිඔය, තෙලඹුගල, මහනුවර (මධ්‍යම පළාත)

| | |
|---|---|
| පත් ඉරු සංඛ්‍යාව | 974 |
| පත් ඉරු අංකනය | ක-ෂී දක්වා |
| පේළි | 09ක් පමණ |
| පේළි අතර අකුරු සංඛ්‍යාව | 141ක් පමණ |
| ප්‍රමාණය | දිග සෙ.මී. 56 පළල සෙ.මී. 5 |
| වර්ෂය | බු.ව. 2408 |
| කර්තෘ | රත්නායක මුදියන්සේලාගේ පුංචිරාල ආරච්චිල |

'ස්වස්ති සිද්ධම්' යනුවෙන් අසිරි පතා ග්‍රන්ථය ආරම්භ කරයි. මූලපරියාය වග්ගයේ මූලපරියාය සූත්‍රය ප්‍රථමකොට ලියා ඇත. අවසානය ද 'සුභමස්තු, ආරෝග්‍යමස්තු හා සිද්ධිරස්තු' වශයෙන් නිමාකොට ඇත.

### අතිරේක දත්ත විස්තරය

"බුද්ධ වර්ෂයෙන් දෙදාසැ හාරසිය නමවෙනි වර්ෂයෙහි පාතදුම්බර උඩගම්පහේ නාපාන රත්නායක මුදියන්සේලාගේ පුංචිරාල ආරච්චිල විසින් මේ මැදුං සඟි පොත්වහන්සේ ලියවා බරපැං ගෙවා ආරණ්‍යවාසී වැලිගොමුවෙ හාමුදුරුවන් වහන්සේ ප්‍රධානකොට මෙම සමාගමේ සංඝයාට සාංඝිකව පූජා කලාය."

මෙහිද පෙර ග්‍රන්ථයේ මෙන් උඩරට උසස් යැයි සම්මත ප්‍රවේණියකට අයත් පුංචිරාල නම් ආරච්චිල කෙනෙකු විසින් කර්තෘත්වය දරනු ලබයි. ව්‍යවහාරික වර්ෂ ක්‍රමයෙන් නම් මෙම කාලය අයත් වන්නේ ක්‍රි.ව. 1864 ටය. එනම් යටත් විජිත යුගයයි. දෙවන විමුක්ති සටනින් (1848) ද වසර 16කට පසුවයි.

## සංයුත්තනිකාය, අත්තරගම රජමහ විහාරය, හාරිස්පත්තුව (මධ්‍යම පළාත)

ග්‍රන්ථ විස්තරය

| | |
|---|---|
| පත් ඉරු | 891 |
| පිටු අංකනය | ක-ලඃ දක්වා |
| පේළි | 10ක් පමණ |
| පේළියකට අයත් අකුරු ගණන | 150ක් පමණ |
| ප්‍රමාණය | සෙ.මී. 58x6 |
| කර්තෘ | සඳහන් නොවේ |
| වර්ෂය | සඳහන් නොවේ |

අත්තරගම රාජමහා විහාරයට අයත් මෙම ලේඛනය දෝෂ බහුල පුස්කොළ රචනාවකි. බහුල ලෙස තීන්ත භාවිත කිරීම නිසා පත්ඉරුවල අපැහැදිලිතාවක් දක්නට ලැබේ. එසේ වුවත් අසම්පූර්ණ නැත. ලාං ලාඃ අංක දෙක එකම පත් ඉරුවක ලියා ඇත.

ආරම්භය 'ස්වස්ති සිද්ධම්' යනුවෙන් ලියා ඇති බවක් පෙන්නුම් කළ ද කියවීමට දුෂ්කරය. අකුරු කීපයක් එකිනෙක අතර ඉඩ තබා ලියා ඇති අතර එය කියවීම ඊටත් වඩා දුෂ්කරය. නමස්කාර පාඨයෙන් අරඹා, ඔසතරණ සූත්‍රය ප්‍රාරම්භකව දක්වා ඇත. ලේඛනය අවසානයේදී,

**"ඉමං ලිඛිත පුඤ්ඤෙන....ගන්ත්වා තුසිතපුරුත්ත මෙ මෙත්තයාන සභා ගන්ත්වා කෙතුමත්ත...පුරවරෙ උප්පජ්ජිත්වා මහාභොගීකුලෙ ඉස්සරතං ගතෙ පඤ්ඤාවා බලසම්පන්නො අභිරූපො මහායසො අභික්කමනාථෙන සද්ධිංචාපි ~~මහාස්ස~~ වෙපබජිත්වා මහාපඤ්ඤො සාරිපුත්තොව සාසනෙ මහාකස්සපෙථෙරොවධුතවා ~~දීඝතෙරතො~~ මොග්ගල්ලානො වගෙසසාමි ජලභිඤ්ඤො මහද්ධිකො. යාති සිප්පානි සයංසි ජඣාභවන්තුමෙ. ඉමං ලිඛිත පුඤ්ඤෙන මෙත්තෙය්‍යං උපසංකම් පතිට්ඨහිත්වා සරණෙ සුප්පතිට්ඨාමි සාසනෙ."**

යනුවෙන් කර්තෘ විසින් ප්‍රාර්ථනයක් සිදුකරනු ලබයි.

දළ පරිවර්තනය: මට මෙය ලියන ලද පිනෙන්...ගොස් උතුම් වූ තුසිත පුරයට ගොස් කේතුමතී...ගොස් පුරවරයෙහි මෛත්‍රී බුදුරදුන්ගේ සභාවට ඉපදී මහාභෝගී කුලයෙහි අධිපති බවට පත්ව ප්‍රඥාවෙන් ද බලවත් බවින් ද රූපවත් බවින් ද කීර්තියෙන් සසුනෙහි මහා ප්‍රඥාවත් වූ සාරිපුත්ත තෙරුන් මෙන් ද ධුතාංගධාරී වූ මහාකස්සප තෙරුන් මෙන් ද ෂඩ් අභිඥාලාභී මහා ඍද්ධි ඇති මුගලන් තෙරුන් මෙන් ද මෛත්‍රී බුද්ධසාසනය සමීපයට යන්නේය. මගේ ස්වකීය වූ අදහස ඉෂ්ට වේවා. මෙය ලියන ලද පිනෙන් මෛත්‍රී බුද්ධසාසනයට එළඹ මැනවින් සරණයෙහි පිහිටමි.

ඉහතින් දක්වන්නට යෙදුණේ උක්ත පාලි පාඨයේ දළ පරිවර්තනයයි. පාලි පාඨයෙහි පවතින අපැහැදිලි වචන නිසාවෙන් පූර්ණ වශයෙන් පරිවර්තනය කිරීම උගහටය. කතුවරයාගේ ප්‍රාර්ථනය ඉතා සුලභ වශයෙන් හමුවන ප්‍රාර්ථනාවකි. මෛත්‍රී බුද්ධ ශාසනය පිළිබඳ දක්වන්නේ ඉතා ප්‍රබල විශ්වාසයක් වුවත් ගෞතම සම්බුද්ධ ශාසනයෙහි වැඩහුන් මහරහතන් වහන්සේගේ ගුණ විශේෂ පිළිබඳව ද ඇල්මක් දක්වයි.

මෙම ලේඛනයෙන් දක්වන්නට යෙදුණු ඓතිහාසික විස්තරය නිරීක්ෂණ මගින් නිගමනය කරන ලද ඒවා නොවන බව සැලකිය යුතුය. පුස්කොළ ලේඛනයේ අගට හමුවන අතිරේක විස්තර ඇසුරෙන් විමසීමට ලක්කරන ලද ඓතිහාසික තොරතුරු එකතුවක් පමණක් බව සැලකුව මනාය.

## ආන්තික සටහන්


1. https://en.wikipedia.org/wiki/Colophon_(publishing), 29/08/2019 @ 10.15 pm.
2. නිව සුත්තසහස්සානි භීයො පංචසතානි ච, සත්ත පඤ්ඤාසසුත්තානි අංගුත්තර සමායුතානි. බු.ජ.මු., 682 පිටුව.
3. සුමනසේකර, ජයන්ත, විනිස පිණිසම වඩින හිමිසඳ, අතිපූජ්‍ය නාපාන පෙමසිරි නාහිමි, සෙනෙවිරත්න ප්‍රින්ටර්ස්, හෝමාගම, 1999, 2 පිටුව.
4. මහාවංශය සිංහල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2012,

579-80 පිටු. බලන්න. බ්‍රිතාන්‍යයන් යටතේ පැවති ලංකාව (කොල්වින් ආර්. ද සිල්වා), ත්‍රිසිංහලේ, (පෝල් ඊ. පීරිස්), සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, (එච්. ඩබ්., කොඩ්රිංටන්).

5. මහාවංශය සිංහල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2012, 454 පිටුව.
6. මහාවංසය, අනූහත්වන පරිච්ඡේදයේ 50වෙනි ගාථාවේ සිට 63වන ගාථාව දක්වා වැලිවිට සරණංකර හිමියන් සමග සිදුකළ ශාසනික මෙහෙවර පිළිබඳ තොරතුරු අන්තර්ගතවේ.
7. නරේශ්වර තෙමේ බුද්ධායතන වූ ද දේවායතන වූ ද සියලු ගම් කෙත් ආදිය පූර්වයෙහි වූ පරිද්දෙන් හා විධි වූ පරිද්දෙන් එසේ ම දානය කොට ඉක්බිති මධුරා පුරයෙන් රාජ කන්‍යාවන් ගෙන්වා මහ බැලැත්තේ දෙපණස් හවුරුද්දක් රාජ්‍ය කෙළේය. එම, 452 පිටුව.
8. ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල විස්තෘතව තිබෙන දීඝනිකාය පුස්කොළ පොත් දත්ත පිළිබඳ විමර්ශනයක්", විමලානන්ද හිමි, දිවුලපැලැස්සේ, Vidyodaya Journal of Buddhist Studies (VJBS), Vol.II, Dept. of Pali and Buddhist Studies, University of Sri Jayewadenepura, Nugegoda, 2013.110, පිටුව.